සැ. යු. - 2025.09.04 වැනි දින පළ කරන ලද අංක 2453 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,454 - 2025 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාදා - 2025.09.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 1098 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 1099 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ඔක්තෝබර් 03 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 සැප්තැම්බර් 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,<br>
කොළඹ 08,<br>
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**<br>
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1097- B 082719 — 5,403 (2025/09)
F 1 -

# පළාත් පාලන නිවේදන

සංශෝධනයයි

**මාතර මහා නගර සභාව**

1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරිය)
71(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1947 අංක 29 දරන මහ නගර සභා ආඥාපනතේ 71(1) වගන්තිය අනුව දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ මාතර මහ නගර සභාව විසින් 2010.12.24 වැනි දින හා අංක 1686 දරන *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද ඉසදීන් නගරයේ අමීනා පාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි සංශෝධනය කර එකී අමීනා මාර්ගය නැවත නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා මහා නගර සභා ආඥාපනතේ 252 අධිකාරිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් අමීනා මාර්ගය මාතර මහා නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**උපලේඛනය**

***අමීනා මාර්ගය***

| | *පාරේ නම* | *පාරේ ආරම්භය* | *පාරේ අවසානය* | *ශ්‍රේණිය* | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | *තාර* | | *කොන්ක්‍රීට්* | | *කාපට්* | | *පස්* | |
| | | | | *දිග* | *පළල* | *දිග* | *පළල* | *දිග* | *පළල* | *දිග* | *පළල* |
| 1 | අමීනා පාර | ඉසදීන් නගරය මීරා පාර | හිත්තැටිය බටහිර කුරුඳුවත්ත පාර | | | | | 36.3m | 6.40m | 16.2m | 6.0m |

නෙලුම් ඒ. ගමගේ,
නාගරික කොමසාරිස්,
මාතර මහා නගර සභාව.

2025 ජුනි මස 25 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

09-105

# විවිධ දැන්වීම්

## කින්නියා ප්‍රාදේශීය සභාව

2025 වසර සඳහා බොරළු, වැලි, ගල් ප්‍රවාහනය කරන වාහන සඳහා වූ මාර්ග නඩත්තු ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(I) උපවගන්තිය සමග කියවිය යුතු 70(1), (2) අංක දරන උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල අනුව කින්නියා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත සඳහන් අවශ්‍යතා සඳහා භාවිතා කරන වාහන සඳහා පහත සඳහන් උපලේඛනය අනුව ගාස්තු නියම කර 2025.08.01 දින සිට අය කරන බව අංක 13 දරන 2025.07.30 වන දිනැති මාසික සභා රැස්වීමේ ගන්නා ලද තීරණය අනුව මින් නිවේදනය කරමි.

ඒ. ආර්. එම්. අස්මි,
සභාපති,
කින්නියා ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 18 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලය,
කවක්කොඩිතිච්,
කින්නියා.

**උපලේඛනය**

| | *රු. ශත* |
|---|---|
| බොරළු කියුබ් 01ක් සඳහා | 300.00 |
| වැලි කියුබ් 01ක් සඳහා | 350.00 |
| ගල් කියුබ් 01ක් සඳහා | 300.00 |

09-83

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.